**උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය - 2020**

**උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර එළඹි 2014 සැප්තැම්බර් 12 දිනැති අංක 5428 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II (බී)(3) වගන්තිය හා 2016 ජූලි 20 දිනැති අංක 5800 - එල්කේ දරන අතිරේඛ මූල්‍ය ගිවිසුම ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව**

**මූල්‍ය ගිවිසුම අනුව, වර්තමාන නාගරික සංවර්ධන, සහ නිවාස අමාත්‍යාංශය, එවකට මහානගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නාගරික සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සහභාගීත්ව නගර කලාපවල තෝරාගත් නාගරික සේවා හා පොදු නාගරික ස්ථාන වැඩිදියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුමට අනුව ව්‍යපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 34,912.48 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 257.08 ක් වන අතර ඉන් රු. මිලියන 27,507 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 202 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 7,405.48 ක මුදල ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යනය කිරීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 05 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 දින වන විට නිමකිරිමට නියමිතව තිබුණි. එසේ වුවත් ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ කාලය 2021 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.**

**1.3 මතය**

**මෙම වාර්තාවේ 02 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියෙහි 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑමට නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කම්කරු උසාවිය මඟින් වන්දි වශයෙන් ගෙවීමට නියම කර තිබුණු රු.මිලියන 1.5 ක මුදල සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | වර්ෂය අවසානයට ගෙවිය යුතු වගකීම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉදිකිරීම් කොන්ත්‍රාත්වලට අදාල රු.මිලියන **2.24** ක රඳවාගත් මුදල් වැරදි සහගත ලෙස රු.මිලියන **22.41** ක් ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ගිණුම්ගත කර තිබුණි. මෙම නිසා, රඳවාගත් මුදල් ශේෂය හා කානු පද්ධති වැඩිදියුණු කිරීමේ ගිණුම රු.මිලියන **20.17** ක් වැඩියෙන් පෙන්නුම් කෙරුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | තථ්‍ය රඳවා ගැනීම් මුදල් ශේෂය මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කළ යුතුය. |

**3.** භෞතික කාර්යසාධනය

**3.1** ව්‍යාපෘතියේ වැඩ කටයුතුවල භෞතික කාර්යසාධනය

| | සංරචකය | කාර්යය | විගණන නිරීක්ෂණ | ප්‍රමාදයට හේතුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති සංවර්ධන අරමුණු (පීඕඩී) | නාගරික යටිතල පහසුකම් සංවර්ධනය | ව්‍යාපෘති ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය **2019** වර්ෂයේ අවසානයට නිම කළ යුතුව තිබුණි. එසේ වුවත්, දුර්වල කාර්යසාධනය හේතුකොටගෙන ව්‍යාපෘති කාලය තවදුරටත් **2021** දෙසැම්බර් **31** දින දක්වා දීර්ඝ කිරීමට සිදු වී තිබුණි. එසේම, ව්‍යාපෘතියෙහි අපේක්ෂිත ප්‍රතිලාභීන් ගණන **600,000** ක් වුවද, තථ්‍ය ප්‍රතිලාභීන් ප්‍රමාණය **400,000** දක්වා අඩු වී තිබුණි. | ව්‍යාපෘතියෙහි දුර්වල කාර්යසාධනය | ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ව්‍යාපෘතියට ලබාදුන් අරමුදල්වලින් එ.ජ.ඩොලර් මිලියන **92** ක් (එ.ජ.ඩොලර් මිලියන **27** ක් කොවිඩ් අරමුදල සඳහා එ.ජ.ඩොලර් මිලියන **65** ක් මහනුවර බහු කාර්ය ප්‍රවාහන අංගනය) වෙත ලබාදීම වේ. | සැලසුම් කළ කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘතියෙහි වැඩකටයුතු අවසන් කර ව්‍යාපෘතියෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් හා කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ගාල්ල නගර සීමාව තුළ ගංවතුර පාලනය | ජලය රඳවා ගැනීමේ ප්‍රදේශ වැඩිදියුණු කිරීම සහ ගංවතුර ජලවහන පද්ධතිය | ගාලු නගර සීමාව තුළ ඉටු කළ යුතු අවශ්‍ය කාර්යයන් පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් පසුව, මොරගොඩ ඇල | ගාල්ලෙහි පිහිටි අදාලවන අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ මනා | තෙත් බිම් කළමනාකරණ සැලසුමක් පිළියෙල කර නොතිබුණි. | අදාලවන අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව ඉඩම් පවරා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කළ |

| | | |
|---|---|---|
| ඉවුරෙහි පිහිටි ස්ථාන 10 ක් ගංවතුර රඳවාගත හැකි ස්ථාන ලෙස උපදේශකවරුන් විසින් හඳුනා ගන්නා ලදී. මෙකී ස්ථාන ගංවතුර රඳවා ගතහැකි ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීම සඳහා මෙම ස්ථාන පිහිටි ඉඩම් පවරා ගැනීමට ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණු අතර තෙත් බිම් කළමනාකරණ සැලැස්මක් පිළියෙල කරද නොතිබුණි. ගාල්ල පරිපාලන සංකීර්ණය ඉදිකිරීම සහ අනෙකුත් ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාවක් හේතුවෙන් ඉහත කී ඉඩම් අත්පත් කර ගැනීම් කටයුතු අත්හිටුවා තිබුණි. ඒ අනුව, අනෙකුත් සම්බන්ධිත පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණය වීමකින් තොරව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම ගාලු නගරය තුළ ගංවතුර පාලන කාණු පද්ධති 16 ක් ඉදිකිරීමේ | සම්බන්ධීකරණයක් නොවීම. | යුතුය. හඳුනාගන්නා ලද මහජන අවශ්‍යතා කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුළින් සපුරාලීමට කටයුතු කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | කටයුතු ආරම්භ කර නොතිබුණු අතර ඒ සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කරගෙනද නොතිබුණි. මෙම තත්ත්වය ව්‍යාපෘතියේ කාර්යසාධනයට සහ ගංවතුර පාලන කටයුතුවලට සෘජුව බලපා තිබුණි. | | | |
| (ඇ) | මහනුවර බහුකාර්ය ප්‍රවාහන පර්යන්තය ප්‍රතිසංස්කරණය කිරීම | - | මහනුවර බහුකාර්ය ප්‍රවාහන පර්යන්තය ඉදිකිරීම් කටයුතු රු.මිලියන **9,316.60** ක (එ.ජ.ඩොලර් මිලියන **60.11)** පිරිවැයක් යටතේ ඉටු කිරීම සඳහා වන මූල්‍යනය කිරීමේ කටයුතු ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය විසින් අත්හිටුවා තිබුණි. ව්‍යාපෘති කාලය තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි වීම හේතු කොටගෙන රු.මිලියන **419.52** ක් වැය කිරීමෙන් පසුව පවා ඉදිකිරීම් අත්හිටුවීමට තීරණය කර තිබුණි. | නැවත පදිංචි කිරීමේ කටයුතු සහ නිර්මාණ සැලසුම් ප්‍රමාද වී තිබීම | නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය විසින් ගන්නා ලද තීරණයකට අනුව උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබුණු මුදලින් එ.ජ.ඩොලර් මිලියන **65** ක් ලෝක බැංකුව විසින් නැවත ඉවත් කර ගන්නා ලදී. | අදාලවන අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව ඉඩම් පවරා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. හඳුනාගන්නා ලද මහජන අවශ්‍යතා කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුළින් සපුරාලීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු 2014 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර ව්‍යාපෘතිය 2021 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 6 ක් ගතවීමෙන් පසුවද වටිනාකම එ.ජ.ඩොලර් මිලියන 35.44 ක් වූ ඉදිකිරීම්, භාණ්ඩ ප්‍රසම්පාදනය කර ගැනීමේ සහ උපදේශන සේවා ලබා ගැනීමේ කොන්ත්‍රාත් 57 ක් පමණක් නිමකර තිබුණි. මෙම වැඩ කටයුතුවල ප්‍රගතිය, ව්‍යාපෘතියේ මුළු වටිනාකම සමඟ සැසඳීමේදී සියයට 17 ක් තරම් අඩු මට්ටමක පැවතුණි. වටිනාකම එ.ජ.ඩොලර් මිලියන 0.66 ක් වූ හඳුනාගත් කොන්ත්‍රාත් 4 ක් ප්‍රසම්පාදන අදියරෙහි පැවතුණි. වටිනාකම එ.ජ.ඩොලර් මිලියන 40.95 ක් වූ කොන්ත්‍රාත් 23 ක් සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | දැනට පවතින වර්තමාන ප්‍රගතිය ඇගයීමෙන් පසුව, ඉදිරි කොන්ත්‍රාත් වැඩකටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය නිවැරදි පියවර ගත යුතුය. |
| (ආ) | රු.මිලියන 1,110.15 ක පිරිවැයක් යටතේ යාපනය පොන්නාලෙයි - පේදුරුතුඩුව පාර (AB21) ඉදිකිරීමේ කොන්ත්‍රාත් කටයුතු 2019 අගෝස්තු 12 දින ආරම්භ කර තිබුණු අතර එහි වැඩකටයුතු 2021 මැයි 15 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවත්, කොන්ත්‍රාත් වැඩකටයුතුවල 2021 මාර්තු වනවිට දිනට භෞතික ප්‍රගතිය අපේක්ෂිත ප්‍රගතිය වූ සියයට 65 සමඟ සැසඳීමේදී සියයට 33 ක් පමණක් විය. මාර්ගයෙහි ඉදිකිරීමට නියමිතව තිබුණු කාණු සහිත බෝක්කු 46 ක් අතරින් බෝක්කු 21 ක් පමණක් සම්පූර්ණයෙන් ඉදිකර තිබුණු අතර බෝක්කු 8 ක් අඩක් නිමවා තිබුණි. අවශ්‍ය ඉදිකිරීම් අමුද්‍රව්‍ය සහ ශ්‍රමය වැඩබිමට ප්‍රමාණවත් පරිදි සපයා නොතිබීම, කාලීනව උපදේශකවරුන් වැඩකටයුතු අධීක්ෂණය නොකිරීම යන කරුණු මෙම ප්‍රමාදයට සෘජුව බලපා තිබුණි. එසේම, මෙම තත්ත්වය සමනය කර ගැනීම සඳහා කොන්ත්‍රාත්තකරු වෙත මාස 2 ක කාලය දීර්ඝ කිරීමක්ද ලබාදී තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යසාධනය ඉතා පහල මට්ටමක විය. | දැනට පවතින වර්තමාන ප්‍රගතිය ඇගයීමෙන් පසුව, ඉදිරි කොන්ත්‍රාත්වල වැඩකටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය නිවැරදි පියවර ගත යුතුය. |
| (ඇ) | යාපනය (AB-31) මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 1,122.9 ක පිරිවැයක් යටතේ පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු ප්‍රමාණ පත්‍රිකාවල සඳහන් රේටයන් අදාල ඉංජිනේරු ඇස්තමේන්තුව සමඟ සසදා බැලීමේදී ප්‍රමාණාත්මක විචලතාවයන් | තාක්ෂණික කමිටු ඇගයීමට භාජනය කිරීමෙන් හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ස්ථාවර ප්‍රසම්පාද කමිටු අනුමැතිය ලැබීමෙන් පසුව මෙම කොන්ත්‍රාත්තුව | (i) දැනට පවතින වර්තමාන ප්‍රගතිය ඇගයීමෙන් පසුව, ඉදිරි කොන්ත්‍රාත්වල වැඩකටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | නිරීක්ෂණය විය. එසේ වුවත්, මේ සම්බන්ධව ව්‍යාපෘතිය විසින් පිරිවැය රේට විශ්ලේෂණයක් සිදුකර නොතිබුණි. එසේම, නිර්මාණ සැලසුම් වෙනස් කිරීම හේතුවෙන් ප්‍රමාණ පත්‍රිකාවල සඳහන් පිරිවැය රේටයන් පසුව වෙනස් කර තිබුණු අතර ඒ හේතුවෙන් ප්‍රමාණ පත්‍රිකාවල සඳහන් රු.මිලියන **85.23** ක වැඩ අයිතමයන් **54** ක් අවලංගු කර තිබුණි. එසේ වුවත්, රු.මිලියන **87.52** ක් අතිරේක වැඩ වශයෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ප්‍රදානය කරන ලදී. | නිවැරදි පියවර ගත යුතුය.<br><br>**(ii)** ප්‍රමාණ පත්‍රිකාවල සඳහන් මිලරේටයන් පිළිබඳ විශ්ලේෂණයක් සිදුකළ යුතුය. |
| (ඇ) | නිර්මාණ සැලසුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් හා එම සැලසුම් මත පදනම්ව ප්‍රසම්පාදන කටයුතු නියමිත කාලය තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන **3,380.70** ක් (එ.ජ.ඩොලර් මිලියන **19.66** ක්) යටතේ යාපනය නගරය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු උප ව්‍යාපෘති **09** ක් සමාලෝචිත වර්ෂය අවසානයට අත්හැර දමා තිබුණි. මෙම නිසා මෙකී උප ව්‍යාපෘතිවලින් ලඟා කර ගැනීමට අපේක්ෂා කළ ප්‍රතිලාභ ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | ව්‍යාපෘතියේ සමස්ථ භෞතික සැලසුම්වලට අනුකූලව ව්‍යාපෘතියෙහි කටයුතු නිම කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ශක්තිමත් හා ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | **2015** වර්ෂයේ සිට ව්‍යාපෘතියේ කටයුතු අකාර්යක්ෂම ආකාරයට ක්‍රියාත්මක කිරීම හේතුවෙන් රු.මිලියන **3,618.18** ක (එ.ජ.ඩොලර් මිලියන **20.19**) ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කර තිබුණු උප ව්‍යාපෘති **5** ක් අදාල කටයුතු නිම කිරීමකින් තොරව අත්හැර දමා තිබුණි. මෙම නිසා මෙම ව්‍යාපෘතිවල ඉදිරි කටයුතු **2021** දෙසැම්බර් **31** දිනට පෙර එනම් ව්‍යාපෘති කාලයට පෙර නිම කිරීම සඳහා දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති **8** ක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන **340.64** කින් සංශෝධනය කර එම ව්‍යාපෘතිවල විෂය පථයද සංශෝධනය කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙකී ව්‍යාපෘතිවලින් ලඟාකර ගැනීමට අපේක්ෂා කළ ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | ව්‍යාපෘතියේ සමස්ථ භෞතික සැලසුම්වලට අනුකූලව ව්‍යාපෘතියෙහි කටයුතු නිම කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ශක්තිමත් හා ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|
| ලැබුණු තොරතුරුවලට අනුව, ණය ලබාදීමේ නියෝජිතායතනය මඟින් ලබාදී තිබුණු රු.මිලියන 27,507 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 202 ක මුදලින් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 6 ½ ක් ගත වූ පසුවද උපයෝජනය කර තිබුණේ එ.ජ.ඩොලර් මිලියන 72.61 කට සමාන රු.මිලියන 11,645.24 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 36 ක් පමණි. එසේම ව්‍යාපෘති කටයුතුවල පැවති දුර්වල ප්‍රගතිය හා ව්‍යාපෘතියෙහි දුර්වල මූල්‍ය පුරෝකතනය හේතුවෙන් රු.මිලියන 732.60 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 3.93 ක් උපයෝජනය කිරීමකින් තොරව 2020 දෙසැම්බර් 31 දින විශේෂ (ඩොලර්) ගිණුමේ රඳවාගෙන තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. ප්‍රථම එ.ජ.ඩොලර් මිලියන 147.0 ක මුදල මූල්‍යනය කිරීම 2014 ජූලි 01 ආරම්භ කළ අතර අතිරේක එ.ජ.ඩොලර් මිලියන 55.0 ක මුදල මූල්‍යනය කිරීම 2016 ඔක්තෝබර් 19 දින සිදු කෙරුණි. ව්‍යාපෘතියෙහි අඩු භෞතික කාර්යසාධනය මුදල් ප්‍රතිපාදනය කෙරෙහි බලපාන ලද අතර එය ක්‍රියාත්මක කිරීමේ ඉලක්ක සඳහාද බලපාන ලදී. | ප්‍රතිපාදනය කරනු ලබන අරමුදල සම්පූර්ණයෙන් උපයෝජනය කළ හැකිවන පරිදි ව්‍යාපෘතියෙහි කටයුතුවල තථ්‍ය කාර්යසාධනය ක්‍රියාකාරී සැලසුම් සමඟ නියාමනය කර විචලනයන් සඳහා ගතයුතු නිවැරදි ක්‍රියාමාර්ග කාලීනව ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණයට අදාළ නිරීක්ෂණ

ව්‍යාපෘතියෙහි විවිධ තනතුරුවලින් සමන්විත තනතුරු 140 කින් යුක්ත වුවද, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු හා ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු තනතුරු යනාදි ප්‍රධාන තනතුරු 16 ක් ඇතුළු පුරප්පාඩු 51 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘති නිලධාරීන් 78 ක් 2014 වර්ෂයේ සිට සේවය හැර ගොස් තිබුණු බවත් දැනට පවතින කාර්යමණ්ඩල සංඛ්‍යාව 2020 නොවැම්බර් මාසයේදී සංශෝධනය කර තිබුණු බවත් තවදුරටත් නිරීක්ෂණය විය. ඉහත සඳහන් කරන ලද කාර්ය මණ්ඩල පුරප්පාඩු හා කාර්ය මණ්ඩල සංශෝධනයන් ව්‍යාපෘතියෙහි දුර්වල කාර්යසාධනයට සෘජුව බලපා තිබුණි.

| කාර්ය මණ්ඩල විස්තරය | තනතුරු සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|
| | අනුමත | 2020 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු/ අතිරික්ත සේවක සංඛ්‍යාව | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශ |
| සියලුම කාර්ය මණ්ඩලය | 140 | 89 | 51 | ව්‍යාපෘතියෙහි විවිධ තනතුරුවලින් සමන්විත තනතුරු 140 කින් යුක්ත වුවද, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු හා ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු තනතුරු යනාදි ප්‍රධාන | නිලධාරීන් බඳවා ගැනීමේ අවශ්‍යතාවය තිබුණද, රජය විසින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට ප්‍රතිපත්තිය | අනුමත කාර්ය මණ්ඩලයට අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තනතුරු **16** ක් ඇතුළු පුරප්පාඩු **51** ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘති නිලධාරීන් **78** ක් **2014** වර්ෂයේ සිට සේවය හැර ගොස් තිබුණු බවත් දැනට පවතින කාර්යමණ්ඩල සංඛ්‍යාව **2020** නොවැම්බර් මාසයේදී සංශෝධනය කර තිබුණු බවත් තවදුරටත් නිරීක්ෂණය විය. ඉහත සඳහන් කරන ලද කාර්ය මණ්ඩල පුරප්පාඩු හා කාර්ය මණ්ඩල සංශෝධනයන් ව්‍යාපෘතියෙහි දුර්වල කාර්යසාධනයට සෘජුව බලපා තිබුණි. | සීමාවන් පැනවීම හේතුවෙන් **2019** වර්ෂයේ අවසාන භාගයේදී සහ **2020** වර්ෂයේදී බඳවා ගැනීමේ සිදු නොකරන ලදී. **2020** වර්ෂය අවසානයේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දීම හේතුවෙන් සේවකයන් බඳවා ගැනීමේ ශක්තිය තවදුරටත් සීමාවන ලදී. මෙම නිසා දැනට සිටින කාර්ය මණ්ඩලය අනුමත කාර්ය මණ්ඩලය සමඟ සැසඳීමේදී ඉතා අඩු මට්ටමක පවතී. |

**3.5** මතභේදයට තුඩුදෙන කරුණු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක **NP/UDH/UD/3/13/1B** හා **2021** පෙබරවාරි **9** දිනැති ලිපිය අනුව, එ.ජ.ඩොලර් මිලියන **27** ක් වූ ව්‍යාපෘතියෙහි ඉතිරි අරමුදල් නාගරික සංවර්ධනය සඳහා වූ ප්‍රමුඛ ව්‍යාපෘතීන් සඳහා යෙදවිය යුතුව තිබුණද, එම ඉතිරිය කොවිඩ් **-19** එන්නත්කරණ වැඩසටහන සඳහා යොදවා තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | මහා භාණ්ඩාගාර නියමයන් අනුගමනය කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය සඳහා මෝටර් රථ කුලී පදනම මත ලබා ගැනීමේ ගිවිසුමට අනුව, එක් මාසයකදී උපරිම වශයෙන් කිලෝ මීටර් **2,500** ක් ධාවනය කළ යුතු අතර ඊට වැඩිවන කිලෝමීටර් ගණන සඳහා අතිරේක ගාස්තුවක් ගෙවිය යුතුය. එසේ වුවත් ධාවනය කළ යුතු උපරිම කිලෝමීටර් **2500** ක ප්‍රමාණය ධාවනය කිරීමට කටයුතු නොකර අතිරේක කිලෝමීටර් **58,575** ක් | මෙම තත්ත්වය ඉදිරි මාසවලදී නිවැරදි කර ගැනීම සඳහා සටහන් කර ගන්නා ලදී. | ව්‍යාපෘතියේ වියදම් අර්ථිකමයභාවය හා කාර්යක්ෂමතාවය යන මූලධර්ම මත වැය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ධාවනය කිරීම වෙනුවෙන් ව්‍යාපෘතිය රු.මිලියන **3.06** ක් වැයකර තිබුණි. එසේම, සමාලෝචිත වර්ෂයේදී වාහන කුලියට ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමට කටයුතු කිරීමකින් තොරව, ඉකුත් වර්ෂයේදී මෝටර් රථ කුලියට ගැනීමට තෝරාගත් සමාගම් දෙකින් මෝටර් රථ කුලියට ගැනීමට කටයුතු කර තිබුණි. | | |
| (ඇ) | මාසික කුලිය රු.**210,000** ක් වූ ද්විත්ව කාර් රථයක් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ භාවිතය සඳහා ලබාදී තිබුණි. එසේ වුවත්, නිල රාජකාරී සඳහා කුලියට ලබාගත් වාහනය භාවිතා කිරීමකින් තොරව, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් තමන්ට අයත් මෝටර් රථය තමාම පදවමින් ධාවනය කර වාහන කුලියට ලබාගත් සමාගම හරහා රු.**2,750,443** ක් ව්‍යාපෘතියෙන් ඉල්ලුම් කර තිබුණි. එසේ වුවත්, ව්‍යාපෘතිය මගින් මෙකී වංචාකාරී ක්‍රියාව සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධව සම්පූර්ණ විමර්ශනයක් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘතියේ වියදම් අර්පීකමයභාවය හා කාර්යක්ෂමතාවය යන මූලධර්ම මත වැය කළ යුතුය. |